# අප ජීවත් විය යුත්තේ බුෂ්ට අවශ්‍ය අන්දමටද?

මේ ලියන මොහොත වන විට ඇමෙරිකානු ජනාධිපති හෙවත් ඊනියා ලෝක ගම්මානයේ ගම්මුලාදෑනි ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් හෙවත් කනිෂ්ඨ බුෂ් ඉරාක ජනාධිපති සදාම් හුසේන්ට ඉරාකයෙන් පිටවීමට දී ඇති පැය හතළිස් අටෙන් පැය තිහක් පමණ ගෙවී ඇත. ඉදිරි පැය කිහිපය තුළ කුමක් සිදුවේදැයි මුළු ලෝකයම බලා සිටිති. පුවත්පත නිකුත් වන අවස්ථාව වන විටද යමක් සිදුවීමට ඉඩ ඇත. ඒ අනුසාරයෙන් ප්‍රභාකරන් කුමක් කරන්නට සැරසී සිටින්නේ දැයි දැන ගැනීමට මෙරට සිටින සියලුම ආකාරයේ බටහිර යටත්විජිතවාදීන්ට නෝර්වේහි උප ඇමැතිවරයකු වූ විඩාර් හෙල්ගසන් හෝ නෝර්වේ තානාපති වෙස්ට්බෝර්ග් හෝ හමුවිය හැකිය. ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් යනු ඇත්තටම කනිෂ්ඨ බුෂ් කෙනෙකි. කනිෂ්ඨයා යන්නෙහි තේරුම් අතර බාලයා යන්න ද වෙයි. මොහු අද බාලයෙක් වෙයි. බුෂ් බලයට පත්වූයේ ඡන්ද නිසි පරිදි ගණන් කිරීමෙන් නොවේ. ඇතැම් ඡන්ද පෙට්ටි පිළිබඳ ප්‍රශ්නයක් වෙයි. එහෙත් විරුද්ධ පාක්ෂිකයන් ඇමරිකන් එක්සත් ජනපදයට අහිතකර විය හැකි බැවින් ප්‍රශ්නය දුරදිග ගෙන යෑමට අකමැති වූ බැවින් බුෂ් ජනාධිපති පදවියේ පසුවෙයි. තමන්ගේ රටේ බහුතර ඡන්දයකින් ජනාධිපතිවීමට නොහැකිවූ කනිෂ්ඨ බුෂ් ඉරාකයේ ජනාධිපති රටින් පිටවිය යුතුයැයි කියයි.

සදාම් හුසේන් මැතිවරණ ගැන විශ්වාස නොකරන්නෙක් විය හැකිය. ඔහු ඒකාධිපතියෙක් විය හැකිය. එහෙත් ඔහු ඉරාකයේ ජනාධිපති ධුරයෙන් ඉවත් කළ යුතු වන්නේ බුෂ් හා ඔහුගේ අතවැසියා වූ ටෝනි බ්ලේයාර් නොවේ. අද බ්ලේයාර්ට සහයෝගය දෙන්නේ ඔහුගේ පක්ෂය වූ කම්කරු පක්ෂයේ මන්ත්‍රීවරුන් නොව කොන්සර්වේටිව් පක්ෂයේ මන්ත්‍රීවරුය. බ්ලේයාර් ද අද බලයේ රැඳී සිටින්නේ එක් අතකින් ගත් කළ මහජන මතයට විරුද්ධවය. එහෙත් ඔහු සදාම් හුසේන් ඉරාකයෙන් පිටවිය යුතුයැයි කියයි. ඇමරිකන් එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය තමන්ට අවශ්‍ය අන්දමට වෙනත් රටවල ජනාධිපතිවරුන් අගමැතිවරුන් ඉවත් කිරීමට තැත් කළ, ඉවත් කළ පළමු අවස්ථාව මෙය නොවේ. මේ රටවලට ඇත්තේ ලෙයින් නැහැවුණු අතීතයකි. එහෙත් ඔවුන් අපේ රටේදී සාම බයිලාව ගයනු දක්නට හැකිය.

සාමය යනු ලෝක දේශපාලනයේ ලෝක බොරුවකි. දේශපාලනයේදී ඇත්තේ බලය හා බලය පිළිබඳ කරුණ පමණය. බලය සඳහා වර්ග, ජාතීන් සටන් කරනු ඉතිහාසය පුරා දැකිය හැකිය. අප ඇමරිකාව ඉරාකයට විරුද්ධව කිරීමට යන යුද්ධයට විරුද්ධ වන්නේ බොරු සාමවාදීන් ලෙස නොවේ. මේ යුද්ධය ඇංග්ලො ඇමරිකන් බලය ලොව පුරා පැතිරවීමට, එහි ආධිපත්‍ය තහවුරු කිරීමට කරන යුද්ධයකි. අපේ රටේ ඊනියා සාමයද ඇංග්ලෝ ඇමරිකන් බලය තහවුරු කිරීම සඳහා නටන නෙයියාඩමක් පමණකි. අප ඒ යුද්ධයටත් මේ සාමයටත් විරුද්ධ වන්නේ ඇංග්ලෝ ඇමරිකන් බටහිර යටත්විජිතවාදයට විරුද්ධවන්නන් ලෙසය. ඇමරිකාව යුද්ධය නතර නොකරන්නේ නම්, අද කළ හැකි නම් කල යුතු දෙය යුද්ධයෙහිදී ඇමරිකාව පරාජය කිරීමය. කෙසේ වෙතත් මෙරට සිටින ඊනියා සාම දූතයන් සාමය සඳහා පිකට් කිරීම සඳහා ඉරාකයට යවාගත හැකි නම් අප ණය වී හෝ එයද කළ යුතුය. එහෙත් ඔවුන් කැමතිවනු ඇත්තේ බ්‍රිතාන්‍යයට හෝ ඇමෙරිකාවට හෝ ගොස් පිකට් කිරීමටය. ඒ සඳහා ඔවුන්ට වැදගත් තර්කද තිබෙන බව රහසක් නොවේ. එහෙත් ඒ තර්ක අපට එතරම් වැදගත් නැත.

ඉරාකයේ රසායනික හා න්‍යෂ්ටික අවි ඇත්නම් ඒ ඉවත් නොකළ යුතු දැයි ප්‍රශ්න කිරීමට ඉඩ ඇත. නමුත් අන් අයට ඇමෙරිකාවේ එවැනි අවි ගැන කතා කිරීමට නොහැකිය. ඇමෙරිකාවේ මතය වී ඇත්තේ ඇමෙරිකාව, බ්‍රිතානය, ප්‍රංශය, රුසියාව හා චීනය හැරෙන්නට අනෙක් රටවල් රසායනික හා න්‍යෂ්ටික අවි යොදා නොගත යුතු බවය. බුෂ් වැනි නායකයකු සිටින රටක න්‍යෂ්ටික අවි තිබිය හැකි නම් වෙනත් රටකද තිබීමේ අනතුර කුමක්ද? බුෂ්ට වඩා බාලයන් කී දෙනෙක් වෙනත් රටවල ජනාධිපතීන් හා අගමැතිවරුන් අතර වෙත්ද? අද ලෝකයට වඩාත්ම තර්ජනය සදාම් හුසේන්ගේ ඉරාකය නොව ජෝර්ජ් බුෂ්ගේ ඇමෙරිකාව බව අමතක නොකළ යුතුය. අවුරුදු හයසියයකට පමණ පෙර ඇරඹි බටහිර නූතනත්වය ක්‍රමයෙන් ලෝකය විනාශය කරා ඇදගෙන යයි. මතුපිටින් ගත් කළ බටහිර විද්‍යාවේ හා තාක්ෂණයේ වර්ධනය හේතුකොටගෙන ලෝකයේ පහසුකම් වැඩිවී ඇති බව සැබෑය. එහෙත් ඒ තාක්ෂණය පිටුපස ඇති බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය ලොවට උරුම කරදී ඇත්තේ විනාශයකි. චින්තන විප්ලවයක් සිදු නොවුවහොත් මිනිසා විනාශවීමේ අනතුරට මුහුණ පා ඇත.

© Prof. Nalin De Silva

ඇමෙරිකාව හා ඒ පසුපස යන බ්‍රිතාන්‍යයට අවශ්‍ය වී ඇත්තේ බටහිර සභ්‍යත්වයේ ඇංග්ලෝ ඇමෙරිකානු සංස්කෘතික ධාරාවට අවශ්‍ය ආකාරයට සෙසු ලෝකය මෙහෙයවීමය අපි ඉතා කෙටියෙන් ප්‍රශ්නය අසමු. අප ජීවත් විය යුත්තේ ඇමෙරිකාවට අවශ්‍ය අන්දමටද? අප සියල්ලන්ම ක්‍රිස්තියානි සංස්කෘතියක ජීවත්වන තුරු ජෝර්ජ් බුෂ් කනිෂ්ඨයාට නින්ද නොයන බව අපි දනිමු. අද ජෝර්ජ් බුෂ් වෙනුවෙන් වැඩ කරන්නෝ රාශියක් මෙරට වෙති. පසුගිය අවුරුදු දහය තුළ මෙරට විශ්වවිද්‍යාල පද්ධතියම ඇමෙරිකානු වීමේ මුලික පියවර ගෙන ඇති බව අවුරුදු දහයකින් පසු විශ්වවිද්‍යාලයක ඉගැන්වීමට ගිය මා ලත් පළමු අත්දැකීම වෙයි. මින් පෙර මෙරට විශ්වවිද්‍යාල බ්‍රිතාන්‍ය අනුගමනය කළ බැවින් මෙහි ඇති විශේෂ හොඳක් හෝ නරකක් හෝ දැකිය නොහැකිය. කවුරුන් අනුකරණය කළත් අනුකාරකයා අනුකාරකයෙක්ම වෙයි. පසුගිය අවුරුදු විසිපහක පමණ කාලය තුළ මෙරට දක්නට ඇත්තේ දළ වශයෙන් ගත් කළ ඊනියා විවෘත ආර්ථිකයක් අනුගමනය කිරීමේ ප්‍රතිඵල නොවේ. විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නේ ජේ. ආර්. ජයවර්ධන බව සැබෑය. එහෙත් යැංකි ඩිකී යනුවෙන් හැඳින්වෙන ඔහු මෙරට ඇමෙරිකානු කිරීමේ ක්‍රියා මාර්ගය අරඹා මිය ගියේ යැයි සඳහන් කිරීම උචිතය. ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ බලවතා වූයේ ඇමෙරිකාව බව තේරුම් ගත් මෙරට දේශපාලනඥයා ඔහු විය. ඒ අනුව ඔහුට ලංකාව පුංචි එංගලන්තයක් නොව පුංචි ඇමෙරිකාවක් කිරීමට අවශ්‍ය විය.

ඊනියා පශ්චාත්නූතනත්වය නමින් වසර හතළිහකට පමණ පෙර බටහිර ඇතැමුන් හඳුනා ගත්තේ එක් පැත්තකින් ගත් කළ ලෝක ආධිපත්‍ය බ්‍රිතාන්‍යයෙන් පමණක් ඇමෙරිකාවට මාරුවීමය. ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඇතිවූ තාක්ෂණික වෙනස්කම්ද මේ ඊනියා පශ්චාත්නූතනත්වයෙහි වෙයි. ලියෝතාද් මහතා සඳහන් කරන පශ්චාත්නූතනවාදී අවශ්‍යතාවයෙහි (පෝස්ට්මොඩර්න් කන්ඩිෂන්) මුලික ලක්ෂණය වන්නේ මේ තාක්ෂණික වෙනස් කමය. එයට අමතරව ඔහු දක්වන වෙනස නම් බටහිර පාර ආඛ්‍යාත (මෙටා නැරේටිව්) නැතිවීමය. මේ දැවැන්ත බොරුවකි. බටහිර තාක්ෂණික වර්ධනයක් ඇතිවී තිබෙන බව සැබෑය. එහෙත් බටහිර දැනුමෙහි හෝ චින්තනයෙහි හෝ මුලික වෙනස්කමක් සිදුවී නැත. මේ ලියෝතාද් මහතා සිතා හෝ නොසිතා හෝ බටහිරයන් නොවන්නන් ගොනාට ඇන්දවීමකි. අපේ රටවල ගොනාට ඇඳීමට සූදානම්ව උම්බෑ කියමින් කල් ගත කරන වස්සෝ හා වැස්සියෝ සුළු ප්‍රමාණයක් වෙති. වාසනාවකට විශ්වවිද්‍යාලවල මේ වස්සන් හා වැස්සියන් එතරම් දක්නට නැත.

ඉරාකයට විරුද්ධව ඇමෙරිකාව කරන පාරම් බෑමෙහිම ලියෝතාද් බොරුව හෙළිවෙයි. පාර ආඛ්‍යාත නැතැයි කියන ලියෝතාද් මහතා ඒ බව කුඩා දේශපාලනය (මයික්‍රෝ පොලිටික්ස්) සමග සම්බන්ධ කරයි. ඔහුට අනුව අද ලෝකයේ ඇත්තේ කාන්තා විමුක්තිය, සමලිංගික නිදහස වැනි කුඩා දේශපාලන න්‍යාය පත්‍රය. එහෙත් ඉරාකයට විරුද්ධව කෙරෙන පාරම්බෑම පිටුපස ඇත්තේ මහේක්ෂම මහේක්ෂ දේශපාලනයක් (මැක්රෝ පොලිටික්ස්) මිස කුඩා දේශපාලනයක් නොවන බව ඕනෑම වස්සකුට හෝ වැස්සියකට හෝ වුවද තේරුම් ගත හැකි යැයි සිතමි. සමාජය යන සංකල්පය නොමැතිව කිසිම සමාජයීය විද්‍යාවක් නොපවතියි. සමාජය යන්න අයත් වන්නේ පාර ආඛ්‍යාතයකට බව අමුතුමෙන් කිව යුතු නොවේ. මහේක්ෂ දේශපාලනයක් නැතැයි බටහිර නොවන්නන්ට උගන්වා බටහිරයෝ මහේක්ෂ දේශපාලනයෙහි යෙදෙති. මෙයටත් වඩා මගෝඩියක් වේද? බුෂ් වෙනුවෙන් වැඩ කරන්නෝ මේ මහේක්ෂ දේශපාලනය වසන් කිරීමට ඊනියා ප්‍රවාදයකට අනුව කටයුතු කරති. ඔවුන් බුෂ්ට මතුපිටින් විරුද්ධ විය හැකිය. එහෙත් එය බොරුවක් හා බොරුවක්ම පමණක් නොවීමට නම් ඔවුන් තම ප්‍රවාද වෙනස් කළ යුතුය.

අපට නව කතා ලියන්නට කියන්නේ ඊනියා පශ්චාත්නූතනත්වයට සරිලන ආකාරයටය. කලා නිර්මාණද ඒ අනුව කළ යුතු යැයි කියැවෙති. බටහිර විද්‍යාව ඇමෙරිකානුවන් ප්‍රධාන බටහිරයන්ට අවශ්‍ය අන්දමට ඉගැන්විය යුතුය. විශ්වවිද්‍යාල ඇමෙරිකානුකරණයට ලක්විය යුතුය. කෙටියෙන් කියන්නේ නම් අප ඇමෙරිකානු ක්‍රිස්තියානි සංස්කෘතියට අවශ්‍ය අන්දමට ජීවත් විය යුතුය. මෙහිදී ඊනියා පශ්චාත්නූතනවාදියකු ලියෝතාද් වැන්නන් ප්‍රංශ ජාතිකයන් බව සඳහන් කර ඔවුන්ට අප ඇමෙරිකානුවන් කිරීමේ අවශ්‍යතාවක් නැති බව පෙන්වාදීමට ඉඩ ඇත. අද ඇමෙරිකාවේ ගණිතය කෙරෙන්නේ නැගෙනහිර යුරෝපීයන් අතිනි. එහි සෛද්ධාන්තික භෞතික විද්‍යාව පොදුවේ ගත්කළ ජර්මන් හා ඔස්ට්‍රියානු විද්‍යාඥයන්ට භාර වී ඇත. ප්‍රංශයෝ සමාජයීය විද්‍යා හදාරති. ඇංග්ලෝ ඇමෙරිකානුවෝ ප්‍රායෝගික ක්‍රියාවල නිතර වෙති. මේ සාමාන්‍යය වෙයි. මෙහි ව්‍යතිරේක ඇත. ලෙව් ස්ට්‍රවුස්ගේ සිට ලියෝතාද් දක්වා ප්‍රංශ සමාජයීය විද්‍යාඥයන් කරන්නේ අයින්ස්ටයින්, හයිසන්බර්ග්, ෂ්රොඩිංගර් වැනි ජර්මානුවන් හා ඔස්ට්‍රියානුවන් සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙහිදී කළ දෙයය. ඔව්හු සියල්ලෝම යථාර්ථයක් ඇතැයි කියන භාග

© Prof. Nalin De Silva

සාපේක්ෂතාවාදීහු වෙති. අපට නවකතා ලිවීමට උගන්වන මිලාන් කුන්දේරා ද නැගෙනිර යුරෝපීයයෙක් වෙයි. මේ සියල්ලෝම එක් අතකින් ගත් කළ ඇමෙරිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් කඩේ යති. මෙරට සිටින මොවුන්ගේ විවිධ ඒජන්තයන් කරන්නේ කඩේ යන්නන්ගේ මල්ල ලිහා කුණු වූ ඇපල් ගෙඩියක් දෙකක් අපට පෙන්න පෙන්නා රස කර කර වමාරා කෑමය. එක්තරා අංකුර කවියෙක් ටික කලකට ඉහතදී බටහිර ක්වොන්ටම් භෞතිකය සිංහල පාඨකයන්ට හඳුන්වා දුන්නේ මා යැයි කීවේය. මා එදා තරම්ලජ්ජාවට පත්වූ වෙනත් දිනයක් නැත. මා උගන්වන්නේ මට අවශ්‍ය ක්වෝන්ටම් භෞතිකය මිස බටහිරයන්ට අවශ්‍ය ක්වොන්ටම් භෞතිකය නොවේ. බටහිරයන්ගේ ක්වොන්ටම් භෞතිකය උගන්වා එහි ඇති දුර්වලකම් ද සඳහන් කිරීමට මම සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ඉගෙන ගත්තෙමි. අප නවකතා ලිවිය යුත්තේ අපට අවශ්‍ය ආකාරයට මිස කුන්දේරා මහතාට අවශ්‍ය ආකාරයට නොවේ. මෙහිදී ලබන බදාදා පළවීමට නියමිත විදුසර පත්‍රයට මා ලියා ඇති ලිපියෙහි කොටසක් උපුටා දැක්වීමට කැමැත්තෙමි.

මෙරට නොයෙකුත් වර්ගවල අධිරාජ්‍ය විරෝධීහු, යටත්විජිත විරෝධීහු වෙති. එහෙත් මේ බොහෝ දෙනා දැනුම සම්බන්ධයෙන් ගත් කළ අධිරාජ්‍යවාදීහු වෙති. බටහිර විද්‍යාව ද දැනුමෙහි කොටසක් වෙයි. දැනුම යනු නිර්මාණය කෙරෙන්නක් බව කියන ඇතැමුන්ට වුවද බටහිර විද්‍යාව ද නිර්මාණය කෙරෙන්වක් බව නොවැටහෙයි. නැතහොත් ඔව්හු එසේ නොවැටහෙන තත්ත්වයකට පත්කරනු ලැබ සිටිති. මෙරට සිටින්නේ යැයි කියන ඊනියා පශ්චාත්නූතනවාදීන්, නව කලා විචාරකයන් ආදීන්ගෙන් ඇසුවහොත් ඔවුන් බටහිර විද්‍යාව වාස්තවික යථාර්ථයක් පිළිබිඹු කෙරෙන්නක් ලෙස සලකනු දැන ගත හැකිය. ඔවුන් එවැනි තත්ත්වයකට පත්කර ඇත්තේ බටහිර දැනුම මගිනි. බටහිර ඊනියා පශ්චාත්නූතනවාදීන්ට අනුව අප ජීවත්වන්නේ භාෂා නිර්මිත අවකාශයකය. ඔවුන්ට අනුව අපේ සිතුම් පැතුම් හසුරුවනු ලබන්නේ භාෂාව විසිනි. මෙහි භාෂාව යන්න ඉතාමත් පටු ක්ෂේත්‍රයක ක්‍රියාත්මක වන්නකි. භාෂාව වෙනුවට සංඥාව යන්න යොදා ගත්තද එහි පටු බවක් වෙයි. අපේ සිතුම් පැතුම් හසුරුවන්නේ සමාජය හෙවත් සංස්කෘතිය යැයි කීවද එය ද පටු බවක් වෙයි. එහි සංස්කෘතික කොටසට අමතරව ජෛවීය කොටසක් ඇතැයි කීවද එයද ප්‍රශ්නයට දෙන එක් පිළිතුරක් පමණි. අපේ සිතුම් පැතුම් හසුරුවන්නේ සංස්කෘතික හා ජෛවීය ආකාරයකින්ය යන්න බටහිර නිෂ්පාදිත දැනුමක් බව මෙරට සිටින ඊනියා පශ්චාත්නූතනවාදී පූස්සනට නොතේරෙන්නේද? ඒ දැනුම විසින් අප මෙහෙයවන බව ඔවුන්ට අබවෝධ නොවන්නේ ඔවුන්ට ඒ දැනුම හැරෙන්නට වෙනත් දැනුමක් නොමැති බව ඒත්තු ගන්වා ඇති බැවින් නොවේද?

අපේ සිතුම් පැතුම් සංස්කෘතිකව, ජෛවීයව හා සාංසාරිකව හැසිරෙවෙන්නේ යැයි කිවහොත් ඒ ගැන මෙරට සිටින අනුකාරක ඇංකරයන් කියන්නේ කුමක්ද? අපේ සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය කෙරෙන දැනුමක සංසාරික සංවරකද ඇතුළත් වෙයි. ගැහැණියක පිරිමියකු ලෙස හෝ පිරිමියකු ගැහැණියක ලෙස (මේ සමාජයේ ගැහැණුන්මෙන් ජීවත්වීමට කැමති පිරිමින් නැතැයි යමකු කියන්නේද?) හෝ ජීවත්වීමට කැමති නම් එයට විවිධ හේතු තිබිය හැකිය. එය ඊනියා පුරුෂෝත්තමවාදයට පමණක් ලඝු කර එය සමාජයේ සාමාන්‍යයක් බවට පත්කළ හැකි නොවේ. සංසාරයේ පිරිමියකු ලෙස ආත්ම ගණනාවක් ගත කළ අයකු මේ භවයේ ගැහැණියක වුවද පිරිමියකු ලෙස ජීවත්වීමට කැමැත්ත දැක්වීමට සම්භාවිතාවක් ඇත. එසේ නැතැයි කිව හැක්කේ සංසාරයක් නැතැයි හෝ සංසාරය යන්න ඊනියා පාරභෞතිකයක් යැයි හෝ කියන්නෙකුටය. යම් පුද්ගලයකු සංසාරයක් නැතැයි කියන්නේ බටහිර දැනුමේ ගොදුරක් බවට පත්වීමෙනි. එහෙත් එසේ කියන්නාට තමා එසේ බටහිර දැනුමේ ගොදුරක් වී ඇති බව නොවැටහෙයි. සංසාරය ඇති බව විද්‍යාත්මකව ඔප්පු කරන්නට යැයි යමෙකු කියන්නේ නම් ඉන් කියවෙන්නේ දැනුමේ උරගල මිණුම් දණ්ඩ බවට බටහිර දැනුම පත්වී ඇති බවය. සංසාරයක් නැතැයි යන්න බටහිර, යුදෙව්, ග්‍රීක, ක්‍රිස්තියානි චින්තනයෙහි ඵලයක් වෙයි. බටහිරයන් අනුව යමින් සංසාරයක් නැතැයි කියන්නෝ සංස්කෘතික ක්‍රිස්තායානීහු වෙති. එහෙත් ඔවුන් පවසනු ඇත්තේ ඔවුන්ට දේශ සීමා නැත ආදී අනම් මනන්ය. තමන්ගේ දැනුමට තමන්ගේ කලාවට දේශ සීමා නැතැයි කියන්නෝ අවසාන විග්‍රහයේහිදී බටහිර දේශ සීමා තුළ ජීවත් වන්නෝ වෙති.

දැනුම සංස්කෘතියෙන් ස්වායත්ත නොවුන බව මේ කරුණුවලින් වුවද පැහැදිලි විය යුතු නමුදු මෙරට සිටින පණ්ඩිතවාදී පූස්සනට ඒ බව නොවැටහෙන්නේ ඔවුන් මොනතරම් භාෂා නිර්මිත අවකාශ ගැන කතා කෙරුවද ඔවුන් ජීවත් වන්නේ බටහිරයයන් විසින් නිර්මිත භාෂා ලෝකයක බැවිනි. මේ බටහිරයන් විසින් නිර්මිත භාෂා ලෝකයෙහි ජීවත් වන්නන්ට වෙනස් සංස්කෘතීන් විසින් නිර්මාණය කෙරෙන දැනුම් ඇති බව නොවැටහෙයි. ඒ ඔවුන් බටහිරයන් විසින් දීනයන් බවට පත් කෙරී ඇති බැවිනි.

© Prof. Nalin De Silva

මුළු මහත් ඇමෙරිකාවම සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වෙයි. එහිද යුරෝපයෙහිද ඇත්තේ ක්‍රිස්තියානි රාජ්‍යය. සතිඅන්ත පත්තර කඩමාල්ලකට වැල්වටාරම් ලියන වියන්ගොඩ නමැත්තෙක් බටහිර ඇති එකම ක්‍රිස්තියානි රාජ්‍ය වතිකානුව බව පවසා ඇත. ඒ ඔහුට බටහිරයන් දී ඇති කුණු වූ ඇපල් ගෙඩියය. ඔහුට එය කෑම හැර වෙන කරන්නට දෙයක් නැත. මුළු මහත් බටහිර දැනුමම පදනම් වන්නේ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහිය. ඒ දැනුම ක්‍රිස්තියානි වෙයි. ඩාවින්ගේ පරිණාමවාදයද මහා පිපුරුම ද ක්‍රිස්තියානි වෙයි. වියන්ගොඩට මේ ගැන තව තවත් දැනගැනීමට අවශ්‍යය නම් විද්‍යුසර කියවිය යුතුය. ප්‍රංශ පොත පතහි නොමැති දේ ද දැන් දැන් සිංහලෙන් ලියැවෙයි. වියන්ගොඩගේ කුතර්ක අනුව බටහිර රටවල ක්‍රිස්තියානි ආගමට තැනක් ඇත්තේ ඒ රටවල රාජ්‍ය ලෞකික නිසාය. ඒ රාජ්‍ය ලෞකික නම් එහි බුද්ධාගමටද තැනක් තිබිය යුතුය. ඒ රටවල ක්‍රිස්තායානියට තරම් තැනක් බුද්ධාගමට හෝ වෙනත් ආගමකට හෝ නැත්තේ ඒ රාජ්‍ය ලෞකික නිසා නොව ක්‍රිස්තියානි නිසාය. එංගලන්තයට ඇස් ඇර ගෙන යන ඕනෑම අයකුට පෙනෙන්නේ ඒ ක්‍රිස්තියානියය. රැජනගේ ඔටුන්නේ හා ලෝගුවේ සිට උපාධි ලෝගුව දක්වා ඇත්තේ ක්‍රිස්තියානිය.උපාධි ලෝගු, ඒ ඒ උපාධි අනුව විවිධ වර්ණ ගන්නේ සාමාන්‍ය පූජකයන්ගේ සිට කාදිනල්වරුන් දක්වා අඳින ලෝගුවල වර්ණ අනුවය. මගේ ජීවිතයට මා උපාධි ලෝගුවක් ඇඳ නැත. මට මොහොතකට හෝ ක්‍රිස්තියානි පූජක වේසයක් සංකේතාත්මකව හෝ ගැනීමට අවශය නැත. එංගලන්තයේ කුරුස කොඩිය දෙවියන් රැජන රකිත්වා යන ජාතික ගීය ආදී මේ සියල්ල ක්‍රිස්තියානි වෙයි. බටහිරයන්ට අවශ්‍ය මේ සංස්කෘතිය අප මත බලෙන් පැටවීමටය. අප ජීවත් විය යුත්තේ ක්‍රිස්තියානි ඇමෙරිකාවට අවශ්‍ය අන්දමට නොවේ. බුෂ් ඉරාකයට විරුද්ධව හමුදා යැවුවහොත් ඒ යවන්නේ පල්ලියේ ආශිර්වාදයෙන් බටහිර ක්‍රිස්තියානි සභ්‍යත්වයේ නාමයෙනි. අවුරුදු පන්සියයකට පෙර බටහිරයන් ඇරඹි ක්‍රිස්තියානිකරණය අවසන් වී නැත. අප ජීවත් විය යුත්තේ බුෂ්ට හෝ ඔහුට කඩේ යන්නන්ට හෝ කඩේ යන්නන්ගේ මල්ලේ ඇති කුණු වූ ඇපල් ගෙඩි කන්නන්ට අවශ්‍ය අන්දමට නොවේ.

**මහාචාර්ය නලීන් ද සිල්වා**

© Prof. Nalin De Silva